# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
## தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
## Ministry of Labour and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.


මගේ අංකය / எனது இல / My No. } MFE/ADM/4/2/1/2

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2023.05. 30

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,

<u>**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයේ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු පවතින අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.**</u>

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයේ පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/අංශය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යක්ෂ | විදේශ රැකියා අංශය | 01 |

02. ඒ අනුව ඔබ ආයතනයේ සුදුසුකම් සහිත නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කර, ඔවුන් ඉහත තනතුර සඳහා අයදුම් කරන්නේ නම්, මේ සමඟ ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2023.06.13 දින හෝ එදිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.ඒ විමලවීර
ලේකම්


ලේකම්/செயலாளர்/Secretary : +94 112 368164 කාර්යාලය/அலுவலகம்/Office : +94 112 581991 ෆැක්ස්/தொலைநகல்/Fax : +94 112 582938/+94 112 368165
විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : slmol@slt.lk / secretary@labourmin.gov.lk වෙබ් අඩවිය/இணையத் தளம்/Web site: www.labourmin.gov.lk

(17)
(17)-a

**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයේ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I වන ශ්‍රේණියේ අධ්‍යක්ෂ තනතුර(ක්‍රමසම්පාදන),**

ඉහත තනතුරට පත්කිරීම පිණිස ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I වන ශ්‍රේණියේ සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඇබෑර්තු සංඛ්‍යාව 01 කි.

1 වන ශ්‍රේණියේ අයදුම්කරුවන් නොමැතිවුව හොත්, II වන ශ්‍රේණියේ වසර 07ක සක්‍රිය සහ සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරීන් අදාළ තනතුරේ රාජකාරී පූර්ණ කාලීනව ඉටුකිරීම සඳහා පත්කිරීම සලකා බලනු ඇත.

මුල් පත්කිරීම වසර එකක උපරිම කාලයක් සඳහා වන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පටිපාටිමය රීති 141 හි විධිවිධානවලට යටත්ව තවදුරටත් සේවා දිගුවක් ලබා දීමේ හැකියාව පවතී.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආකෘතියෙන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද තම ජීව දත්ත පත්‍රිකාව තම අංශ ප්‍රධානියා හරහා ලේකම්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, 06 වන මහල, මෙහෙවර පියස, නාරාහේන්පිට වෙත 2023.06.13 දින හෝ ඊට පෙර ලැබෙන්නට සැලස්විය යුතුය

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර, අසම්පූර්ණ අයදුම්පත්‍ර හා නියමිත ආකෘතියෙන් ඉදිරිපත් නොකරන අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2.0 අපේක්ෂක පැතිකඩ**

**2.1 පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්**

i. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ වසර 03 ක පළපුරුද්ද තිබීම වඩාත් උචිතය.
ii. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ (ඉ) පරිශිෂ්ඨයේ නිශ්චිතව දක්වා ඇති කවර හෝ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම්
iii. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව

**2.2. ශක්තීන්**

(කාර්යයන් සඵලව ඉටු කළ යුතු අතර එය අයදුම්කරු අභිප්‍රේරණය කළ යුතුය)

i. නවෝත්පාදක
ii. ගැටලු විසඳන්නා
iii. කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරන්නා

**2.3 චර්යාමය නිපුණතා**

i. වෙනස්වීම හා වැඩි දියුණුවීම
ii. එක්ව කටයුතු කිරීම
iii. සන්නිවේදනය හා බලපෑමක් ඇතිකිරීම

17-6

### 3.0 තෝරාගැනීමේ ක්‍රමවේදය

ජ්‍යෙෂ්ඨත්වය හා ජීවදත්ත පත්‍රිකාව හරහා කුසලතා ඇගයීම හා සම්මුඛ සාකච්ඡාවක් මත පදනම්ව තෝරා ගැනීම සිදු කරනු ඇත. කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් සම්මුඛ සාකච්ඡාව සඳහා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ නිර්ණායක සඳහා කරුණාකර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2022.09.15 දිනැති අංක 02/2022 දරන චක්‍රලේඛය බලන්න.

### 3.1 ලකුණු ලබා දීමේ ක්‍රමවේදය

| මාතෘකාව | උපරිම ලකුණු | ඇගයීම් ක්‍රමවේදය |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨත්වය**<br>වඩාත්ම ජ්‍යෙෂ්ඨ අයදුම්කරුට උපරිම ලකුණු ප්‍රදානය කරන අතර අනෙකුත් අයදුම්කරුවන්ට ජ්‍යෙෂ්ඨත්වය අනුව සමානුපාතිකව ලකුණු හිමිවනු ඇත. | 50 | ජීවදත්ත පත්‍රිකාව/සම්මුඛ සාකච්ඡාව |
| **සංවර්ධන සැලසුම්කරණයේ පළපුරුද්ද**<br>ක්ෂෙත්‍රයේ සේවා කාලයේ දීර්ඝත්වයට/විෂයට නිරාවරණයට අමතරව කම්කරු හා මිනිස්බල ක්ෂෙත්‍රය හා සම්බන්ධ වී කටයුතු කිරීම හෝ ඊට නිරාවරණය වීම මගින් ලබාගත් එම විෂයය පිළිබඳ දැනුමෙහි පෘථුල බව හා ප්‍රවීණත්වය | 20** | |
| **වෘත්තීය සුදුසුකම්/ පර්යේෂණ හා නව්‍යකරණය**<br><br>**(1) සේවා ව්‍යවස්ථාවේ (ඉ) පරිශිෂ්ඨයේ නිශ්චිතව දක්වා ඇති කවර හෝ ක්ෂෙත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම්**<br><br>අ. පර්යේෂණ පාදක පශ්චාත් උපාධිය - ලකුණු 7<br>ආ. මොඩියුල පාදක පශ්චාත් උපාධිය - ලකුණු 6<br>ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 5<br>ඈ. උපාධි/පශ්චාත් උපාධි සහතිකය/ උසස් ජාතික ඩිප්ලෝමාව - ලකුණු 4<br>ඉ. ඩිප්ලෝමා -3<br><br>(2) සංවර්ධන සැලසුම්කරණයේ පුහුණුව (උපරිම ලකුණු 1.0 දක්වා0<br><br>අ. මාස 3 ක කාලසීමාව හෝ ඊට වැඩි - ලකුණු 1<br>ආ. දින 10 ක කාලසීමාව හෝ ඊට වැඩි - ලකුණු 0.5<br>ඇ. දින 3 ක කාලසීමාව හෝ ඊට වැඩි - ලකුණු 0.2<br><br>**(1) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව**<br>අ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව/IELTS සමස්ත අධ්‍යයන ලකුණු 6.5 හෝ ඊට වැඩි, TOEFL-CBT 79 හෝ ඊට වැඩි හෝ TOEFL-PBT හෝ ඊට වැඩි - ලකුණු 2 | 10 | |

(17) -e

| | | |
|---|---|---|
| ආ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා සහතිකය - ලකුණු 1<br>• ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු පිරි නැමේ. | | |
| **ශක්තීන්**<br>ඵලදායි අන්දමින් කාර්යයන් සිදුකළ යුතු අතර ඉහත 2.2 හි නිශ්චිතව දක්වා ඇති පරිදි එමගින් අයදුම්කරු අභිප්‍රේරණය විය යුතුය | 10** | |
| **චර්යාමය නිපුණතා**<br><br>ඉහත 2.3 නිශ්චිතව දක්වා ඇති පරිදි ඵලදායිව සිදුකළ යුතු ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරකම් | 10** | |
| ** ප්‍රශ්නපත්‍ර ආකෘති සහ ශ්‍රේණිගත කිරීමේ පරිමා සඳහා කරුණාකර 2022.09.15 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ ඇමුණුම ii බලන්න. | | |

සටහන 1: ඉහත ලකුණු ලබා දීමේ ක්‍රමවේදයේ "පිළිගත් විශ්වවිද්‍යාලය" යන්නෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් අදහස් වේ.

සටහන 2: ඉහත ලකුණු ලබා දීමේ ක්‍රමවේදයේ සඳහන් කර ඇති සියලු පශ්චාත් උපාධි/වෘත්තීය සුදුසුකම්:

i. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිදයාලයකින් හෝ (උපාධි පිරිනමන වෙනත් ආයතනවලින් ලබාගත් එවැනි සුදුසුකම් එම කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබිය යුතුය.)

ii. රජයේ පුහුණු ආයතනයකින් හෝ රජය පිළිගත් විදේශ ආයතනයකින් ලබා ගෙන තිබිය යුතුය.

ලේකම්

දිනය: 2023.05.30

ජීවදත්ත පත්‍ර ආකෘතිය

1. අයදුම්කරන තනතුර :-
2. අයදුම්කරු පිළිබඳ විස්තර
   - i. නම :-
   - ii. ජාතික හැඳුනුම්පත් අංකය :-
   - iii. වයස :-
   - iv. පදිංචි ලිපිනය :-
   - v. දුරකථන අංක :-
   - vi. විද්‍යුත් තැපැල :-
   - vii. සේවයේ ශ්‍රේණිය :-
   - viii. සේවයේ පත්වීමේ දිනය :-
   - ix. සේවයේ වත්මන් ශ්‍රේණයට උසස්වීම් ලැබූ දිනය:-
   - x. තනතුරු නාමය :-
   - xi. වත්මන් තනතුරට පත්වූ දිනය:-
   - xii. අමාත්‍යාංශය :-
   - xiii. දෙපාර්තමේන්තුව :-

3. වත්මන් ශ්‍රේණියේ සේවය පිළිබඳ විස්තර
   - i. වැටුප් රහිත/අර්ධ වැටුප් නිවාඩු

| සිට | දක්වා | මුළු කාල පරිච්ඡේදය (වර්ෂ/මාස/දින) | කාර්යය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

   - ii. කාර්යක්ෂමතා කඩඉම

| කාර්යක්ෂමතා කඩඉම | සම්පූර්ණ කිරීමට නියමිත දිනය | සම්පූර්ණ කළ දිනය | සහනය/නිදහස් කිරීම ප්‍රදානය කළ ලිපියේ අංකය හා දිනය, තිබේ නම් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

   - iii. විනය ක්‍රියාමාර්ගයකට යටත් කරනු ලැබ ඇත්නම්:

| චෝදනා පත්‍රයේ දිනය සහ අංකය | විනය නියෝගය (තවමත් විභාග වෙමින් පවතින්නේ නම්, කරුණාකර සඳහන් කරන්න | දඬුවම/දඬුවම් බලාත්මක වූ දිනය(එනම් වරද සිදුකළ දිනය), අදාළ නම් පමණක් | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාටිමය නීති 186(ii) ප්‍රකාරව සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී අත්හැර දමන කිසියම් සේවා කාලයක් වේ නම් එය ස දහන් කරන්න |
|---|---|---|---|
| | | | |
| | | | |

4. පළපුරුද්ද:

4.1 සේවයට පත්වීමේ දිනයේ සිට පසුගිය සේවය

| තනතුර | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය | කාල සීමාව | | වගකීම්වල ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක් |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |

**4.2** අදාළ විෂය පිළිබඳ පළපුරුද්ද (රාජකාරි පැවරුම් ලිපිවල සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතුය.)

| තනතුර | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය | කාල සීමාව | | වගකීම්වල ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක් |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |

4.3 සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ ඔබ ලබා ගෙන ඇති දැනුම යොදා ගනිමින් ඔබ කටයුතු කළ විසඳූ අභියෝගාත්මක සිදුවීමක් කරුණාකර කෙටියෙන් විස්තර කරන්න, (උපරිම වචන 150) හෝ;

සංවර්ධන සැලසුම්කරණයේදී යම් සිදුවීමකට අදාළව ඔබ ඔබේ නිර්මාණශීලීත්වය සහ නව්‍යකරණය යොදාගත් අවස්ථාවක් විස්තර කරන්න (උපරිම වචන 150)

5. වෘත්තිමය සුදුසුකම් *(සහතිකපත්‍රවල සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතුය.)*

5.1 පශ්චාත් උපාධි සුදුසුකම්

| පශ්චාත් උපාධි සුදුසුකම | විෂය | විශ්වවිද්‍යාලය/ආයතනය | බලාත්මක දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

5.2 පුහුණුව

| පුහුණුව | ආයතනය/සංවිධානය | කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

5.3 භාෂා ප්‍රවීනතාව

| භාෂාව | සුදුසුකම/ආයතනය/සංවිධානය | බලාත්මක දිනය |
|---|---|---|
| | | |
| | | |

ඉහත තොරතුරු මාගේ උපරිම දැනුමට අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

....................................................

අයදුම්කරුගේ අත්සන

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතික කිරිම*

විකල්පය I - මෙම ජිවදත්ත පත්‍රිකාවේ 3 වන වගන්තියේ ඉදිරිපත් කර ඇති විස්තර අයදුම්කරුගේ පුද්ගලික ලිපිගොනුවේ යාවත්කාලින කරන ලද වාර්තා අනුව නිවැරදි බවත්, මේ වන විට අයදුම්කරුවට* එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් නොපවතින බවත්, මේ තනතුර සඳහා අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙක් ඇතිව/ නොමැතිව ඔහුගේ/ඇයගේ වත්මන් තනතුරෙන් නිදහස් කිරීමට හැකි/නොහැකි බවත් මම සහතික කරමි.

විකල්පය II - මෙම ජිවදත්ත පත්‍රිකාවේ 3 වන වගන්තියේ ඉදිරිපත් කර ඇති විස්තර අයදුම්කරුගේ පුද්ගලික ලිපිගොනුවේ යාවත්කාලින කරන ලද වාර්තා අනුව නිවැරදි බවත්, මේ තනතුර සඳහා අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙක් ඇතිව/ නොමැතිව ඔහුගේ/ඇයගේ වත්මන් තනතුරෙන් නිදහස් කිරීමට හැකි/නොහැකි බවත් මම සහතික කරමි. අයදුම්කරු සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් වත්මනෙහි සිදු කරමින් තිබෙන බවත්/ආරම්භ වීමට නියමිත බවත් අයදුම්කරුට එරෙහිව ඇති චෝදනාවල/ සිදු කළේ යැයි සැක කරනු ලබන විෂමාචාර ක්‍රියාවල ස්වභාවය පහත පරිදිය.

....................................................................................................................................................

....................................................................................................................................................

....................................................................................................................................................

....................................................................................................................................................

*අදාළ නොවන ප්‍රකාශනය කපා හරින්න

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන